

# නුවනැති ගොවියෙක්

කතාව—එස්. එන්. දිසානායක විසිනි.

හලාවත තිස්සෝගම මුගුණවටවන දැනට නිවැසි අවුරුදු 47ක් වයස් වූ හෙට්ටි ආරච්චිගේ ජෝසප්පු උපන්නේ හලාවත දිස්ත්‍රික්කයේ මල්වත්ත නමැති ගමේ ය. තමා කුඩා කල තම ආදරණීය පියා මළ බැවින් එකම සොහොයුරිය හා තමාගේ පණට දෙවැනි නුවූ අදරැති අම්මාද රැක ගැනීමේ හා පෝෂණය කිරීමේ භාරදූර කාර්යය මෙම අවංක පුද්ගලයාගේ කරපිටට පැවරීගෙන එන සමයේ මුන්නේස්වරම් බොදු පාසැලේ සත්වැනි පියවර දක්වා කළ තමාගේ ඉගෙනීම අත්හිටුවා සමාජයේ අනික් අයට මෙන්ම මොහුටත් එක සමාන වූ ජීවිත සටනේ ඉදිරිගමන ආත්ම විශ්වාසයෙන් හා ප්‍රීතියෙන්ද ඇරඹුවේය.

1936 පමණ වූ මේ අවධියේ ඔහු වයස අවුරුදු 16ක් පමණවූ නාඹර කොළුගැටයෙකි. තමාගේ මෙන්ම තම දයාබර මවගේ හා ආදරණීය සොහොයුරියගේද වටිනා අහිංසක වැඩදායී ජීවිත පෝෂණය කිරීමට අදිටන් කර ගත් ජෝසප්පු ගැටවරයා සුළු කඩපොඩ්ඩක් දමාගෙන නිවහල් සාමකාමී ජීවිතයක් ගත කරන සමයෙහි දෙවැනි ලෝක සංග්‍රාමයේ අඳුරු යුද බිය ලංකාව ඇතුළු ලෝ සැමතැන හිරුරැස මෙන් පැතිර ගියේ ය. මෙම ප්‍රචණ්ඩ යුගයේ රටතුළ ආහාර හිඟ වූ බැවින් හේන් ගොවිතැන් සඳහා ගොවියන් වෙත රජය මගින් ඉඩම් බෙදා දීම ඇරඹුණි. එහෙත් වයස අඩු අවිවාහක මොහුට ඉඩම් දීමට රජය අකැමැත්ත පළකළ බැවින් ඉඩම් ලත් වෙනත් කාරුණික ගොවියෙකුගෙන් සාරවත් වැව්තාවල්ලකින් හේන් අක්කර $\frac{1}{4}$ක් ලබා ගෙන හේන් පොඩි-වී නමැති ගම්බද වී වර්ගයෙන් සේරු 6ක් වපුරා වී බුසල් $13\frac{1}{2}$ක පමණ ඉතාමත් උසස් අස්වැන්නක් ලබා ගත්තේ ය. මෙම උසස් අස්වැන්න නිසා මෙම ගොවි මහතාගේ ගොවිතැන පිළිබඳව තද ඇල්මක් හා ලැදියාවක් ඇති විය. ගොවිතැනට හිත වැටුණ ඔහු තමාට වයස 22ක් පමණ වෙනතෙක් කුඹුරු වැඩෙහි යෙදෙමින් ජීවත් විය. ඒ අතර මුන්නේස්වරම් ගමට නුදුරු ගමක ගම්මුලාදෑනි මහතාට අයත් ඉඩමක තක්කාලි හා මිරිස් වගාවද ඇරඹූ ඔහුට උසස් ආදායමක් නොකඩවා ලැබුණ නමුදු ඉඩම අයිති ගම්මුලාදෑනි තැන ඔහුගෙන් කිසිත් මුදලක් හෝ ආදායමක් ලබා නොගත්තේ ය. එකල වයස 27ක් වූ මොහු ඊට නුදුරු ගමකින් විවාහයක් කරගෙන තිසෝගම පදිංචි වී ආණ්ඩුවේ බදු ඉඩම් අක්කරයක් හතර අවුරුද්දකට බදු ගෙන මඩ ගොවිතැන මුන්නේශ්වරමේද, ගොඩ ගොවිතැන තිසෝගමද සාර්ථක ලෙස මාරුවෙන් මාරුවට කර ගෙන ගියේ ය. මෙකල මේ දක්ෂ ගොවියා නවීන ගොවිතැන් ක්‍රම දැන නොසිටියේ නමුදු, එකල ඔහුගේ ඉඩම් තිබූ පලාතේ ආහාර නිෂ්පාදන ඕවර්සියර් රත්නායක මහතාගෙන් ගොවිතැන පිළිබඳ වටිනා උපදෙස් රාශියක් ලබා ගැනීමට හැකි වුවා පමණක් නොව මිරිස්

කොළ කොඩවීම පළමුවරට සාර්ථක ලෙස ටොක්සිfපින් නමැති බෙහෙත යොදා මර්ධනය කර ගැනීමට පුළුවන් වීය.



**පුරුෂයා හා භාර්‍යාව එකට ගොවි වැඩ කරන අයුරු**

1949-1950 පමණ වූ මේ කාලයේ පළාතේ ග්‍රාම සංවර්ධන සමිතියේ සාකච්ඡා සභාවලට සහභාගිවීම මොහුගේ සිරිතක්ව තිබුණ අතර එක් දිනක අහම්බෙන් සමිතියට පැමිණි සොයිසා නමැති රජයේ නිලධාරි මහතෙකු ගේ මුදල් ඉතිරි කිරීම පිළිබඳ පැවැත්වූ සාර වත් දේශනයකට කන් දුන් ඔහු ඒ ගැන අතිශයින්ම පැහැදුණි. ඔහුගේ ආදර්ශමත් රසවදන මෙසේ වීය—බුදු රජාණන් වහන්සේ ගේ සිතීමේ පැතීමේ හා පෙරුම් පිරීමේ බල යෙන් බුදුබව අත්කර ගත් බවත්, එමෙන්ම හිට්ලර්, මුසෝලිනි වැනි අය පවා සිතීමේ පැතීමේ බලයෙන් තම අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීමට උත්සාහ ගත් බවත් හා ඒ අනුව ඉතිරි කිරීමේ ඉලක්කය රු. 1,000 ක් විය යුතු බවත් සභාවට දැන්වීය. මෙම කථාව නිසා ඔහුට එම කන්නයේදී අක්කර ½ක මාළු මිරිස් වගාවෙන් රු. 1,500ක් ඉතිරි කර ගැනීමට පුළුවන් විය. මේ කන්නයේ ගොවි තැන් කළ පිළිවෙලට අව්ව, වැස්ස, බඩගින්න ආදී මහත් දුක් කම්කටොළු නොතකා, ඔහු ගේ අධිෂ්ඨානය පරිදි තවදුරටත් වෙහෙස මහන්සි වී ගොවිතැන් කළොත් ශරීර සෞඛ්‍යය අතින් ඉතා දුර්වල අභේනියකට මුහුණ පාන්නට සිදු වන බැව් තේරුම් ගත් ඔහු තමන්ට ලැබුණ මුදලින් රු. 1,000 ක් සේවිංස් බැංකුවේ තැන්පත් කර සියළු ණය තුරුස්වලින් නිදහස් වී ඉතිරි මුදලින් රු. 85 කට ස්ප්‍රේ යන්ත්‍රයක් මිළයට ගෙන කලින් පාවිච්චි කළ ස්ප්‍රේ අත් යන්ත්‍රය පැත්තකට කළේය. ඉන් පසු 57-60 කාලයේ තවත් ඉඩම් අක්කර දෙකක් බද්දට ගෙන මාළු මිරිස් හා පිපිඤ්ඤා සාර්ථක ලෙස වගා කර ඔහු ඉන් නොබෝ කලකින් පළමු ඉඩම් අත්හැර අක්කර පහක වෙනත් ඉඩමක් බද්දට ගෙන එහිද මාළුමිරිස් වගා කරමින් තම ගොවි වැඩ තව තවත් දියුණු කර ගත්තේය. මේ කාල සීමාවේදී කාක්ක පල්ලි යේ කෘෂිකර්ම උපදේශක මහතාගෙන් මොහුට බොහෝ උපදෙස් ලැබුණ බැවින් තම වගාවන් ක්‍රමාණුකූලව කරගැනීමට අවස්ථා වක් ලැබුණි.

දැනට ඔහු ලත් අත්දැකීම් අනුව අක්කර ½ක මාළුමිරිස් වගාවෙන් රු. 2,500ක ආදා යමක් ලබා ගත හැකි බැව් ඔහුගේ හැඟීමයි. ඔහුගේ හැඟීම අනුව, මාළුමිරිස් වගාව ලාභ ගෙන දෙන පිළිවෙලට සාර්ථක ලෙස ලංකාවේ ගොවිතැන් කිරීමට නුපුළුවන් වී ඇත්තේ මහජනයාගේ මේ පිළිබඳ ඇති දැනීම මඳ නිසා බැව් පෙනී යයි. එනම් බොහෝ දෙනා ගේ අදහස් වනුයේ මිරිස් පැළ සම්පූර්ණ යෙන් වැඩී මල් ඵල හට ගන්නා තුරු පමණක් සැප සාත්තු කිරීමෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි බවය. නමුත් මොහු ගේ අත්දැකීම් අනුව මිරිස් ගසකින් උපරිම ප්‍රයෝජන හා උසස් අස්වැන්නක් ලබා ගැනී මට නම්, මිරිස් ගසේ මල් ඵල හට ගත් පසු වද පෝර දැමීම, ජලය යෙදීම, වල් පැළ විනාශ කිරීම ආදී සැප සාත්තු මිරිස් ගස් ජීවත්වන අවසාන කාලය තෙක්ම කළයුතු බවයි. ඒ අනුව ඔහුගේ පළපුරුද්ද අනුව

බොහෝ ගොවියන්ගේ සිත දුර්වල වන්නේ වගාවට නියමි සැප සාත්තු නොමැතිකමින් වගාවේ අස්වැන්න අඩු වීම නිසාය.

මේ අතර මොහු පදිංචි වී සිටින ගෙවත්තේ කුඹුරු අක්කර ¼ක් පමණ අස්වැද්දාගෙන ඔහුගේ පවුලේ කෑමට අවශ්‍ය වී නිපදවා ගැනීමට මඩ ගොවිතැන් කිරීමටද පුරුදු වී සිටී. ඒ වැඩ කොටසින් ඔහුගේ පිරිමි දරුවන් හතර දෙනාටද මඩ ගොවිතැන පිළිබඳ මනා පුහුණුවක් ලැබෙන අතර ඔහුගේ පවුලට අවුරුද්දකට අවශ්‍ය සහල් ප්‍රමාණයද එමගින් ලැබේ. මේ කුඹුරෙන් ඔහු කලින් සකස් කළ සුළු ප්‍රමාණයෙන් වී සේරුවක් වපුරා එච්-4 වී වර්ගය—අක්කරයකට බුසල්-90ක අස්වැන්නක් ලබා ගත්තේය.

දැනට මොහු අක්කර 7ක බිම් ප්‍රමාණයෙන් අක්කර 4ක පමණ ගොවිතැනට මාළුමිරිස් වගාව සඳහා සකස් කර ගෙන යයි.

මොහු මිරිස් වගා කිරීමට නව ක්‍රමයක් සොයා ගෙන ඇත. එනම් බිම් මනා ලෙස මට්ටම් කොට මිරිස් වලවල් 100ක් ඉදි කළ හැකි බිම් කොටසක් ඇතුළත ජලය රැඳවීමට හැකි වන පරිදි ලියදි ක්‍රමයට සකස් කරනු ලැබේ. ඉන් පසුව එම කොරටුවේ තැනින් තැන ජලය රැඳවිය හැකි වලවල් හතරක් හාරා කොරටුව ළඟ ඇති ළිඳකින් මෙම වල වල් වලට ජලය පුරවනු ලැබේ. ඉන් පසුව වල වල් වල පිරී ඇති ජලය නැවතත් වගාවේ ලියදිවලට සුමානයකට වතාවක් හෝ දෙවතාවක් පොම්ප කරනු ලැබේ. මේ ක්‍රමය අනුව මෙම ගොවියාට මාළු මිරිස් වගාවෙන් වෙන දාට වඩා ඉතා අධික අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වී ඇත.

ක්‍රම ක්‍රමයෙන් තමන්ගේ නුවණ මෙහෙයවා ක්‍රමානුකූල පිළිවෙලට මාළුමිරිස් වගා කල මේ ගොවියා ඔහුගේ ගොවිවැඩ නිසාම අද දියුණුවී ඇති බැවින් ඔහු අපට ඉමහත් ආදර්ශයක් ගෙනහැර පායි. තවද ඔහුගේ දියුණුවට ප්‍රධාන හේතුව කලින් කලට ඉඩම් කොටස් වෙනස් කරමින් මාළු මිරිස් වගාව සිදුකිරීම නිසා රෝග බෝවී යෑම අඩුවීම නිසා විය හැක. නවීන සශ්‍ය මාරු ක්‍රමයේදීද අප ක්‍රියාවට නගන්නේද මෙවැනි ක්‍රමයක්මය.

මෙම කන්නයේදී බිත්තර වී වලට වෙනද නොමැති මහජන ඉල්ලුමක් ඇති වන බැව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව රපෝර්තු කරයි. බලාපොරොත්තු නොවූ මෙවැනි ඉල්ලුමක් ඇති වීම කරුණු දෙකක් නිසා සිදුවී ඇතැයි අපේක්ෂා කෙරේ. 1966 යල් කන්නයේ අස්වැන්න පාළුවීම මින් එක කරුණක් වන අතර සහල් හිඟය නිසා නිදහස් වෙළඳ පොළේ වී වලට උසස් මිළක් ලැබීම නිසා, වැඩි වැඩියෙන් මහජනයා උසස් වී වර්ග වගා කිරීමට පෙළඹීම දෙවැනි කරුණ වෙයි. ඒ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බිත්තර වී ඉල්ලුම සපුරාලීමට නම් මෙවර අස්වැන්නෙන් සිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් බිත්තර වී ලබා ගත් අය තමන්ගේ අස්වැන්නෙන් කොටසක් බිත්තර වී වශයෙන් වෙන් කොට තැබිය යුතුය. රටට අවශ්‍ය බිත්තර වී සැපයීමේ භාරදූර කාර්යය ඉටු කල හැක්කේ මෙවැනි ක්‍රමයකින්ය.



4—එච 135 (66/10)